# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2189/48 - 2020 අගෝස්තු ම 21 වැනි සිකුරාදා - 2020.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී නොවීම හේතුකොට ගෙන වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ අධිකාරිගෙදර නිමල් රෝහණ අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා බස්නායක මුදියන්සේලාගේ ඉන්ද්‍රවංස සමන්ත ඩිලාන් බස්නායක නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, මලවැන්න ගොඩගේ ලලිත් ආනන්ද වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් බස්නායක මුදියන්සේලාගේ ඉන්ද්‍රවංස සමන්ත ඩිලාන් බස්නායක, වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. ජී. ලලිත් ආනන්ද,
තේරීම්භාර නිලධාරි,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2020 අගෝස්තු මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
වවුනියාව.

09 - 115


1A - G 32716 — 29 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*